

## දේශපාලන පුවත්පත් කලාවේ නම රැන්දූ

# සිරිලාල් කොඩිකාර

සටහන හා සේයාරූ
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

### සිරිලාල් කොඩිකාර

*ඔහු මෙලොව එළිය දකින්නේ මහනුවර, තලාතුඔය, උඩමුල්ල ග්‍රාමයේදීය. ඒ 1924 අගෝස්තු මස 27 වන දිනය. දෙමාපියෝ ඔහුට නම් තැබුවේ කොඩිකාරගේ ඒබ්‍රහම් පීරිස් ලෙසිනි.*

*සොහොයුරන් දෙදෙනෙකු සහ සොහොයුරියකගේ ඇසුරේ කොඩිකාර දරුවාගේ මුල් ළමා විය ගෙවුණේ තලාතුඔය ඔහු උපන් නිවෙසේමය. වඩු කාර්මිකයකු වූ තම පියාට කෑගල්ලේ රබර් වත්තක් බලාගෙන සිය කර්මාන්තයෙහිද නියැළෙන්නට අවස්ථාවක් ලැබීම හේතුවෙන් බාල කාලයේදී කොඩිකාර පවුලේ පදිංචිය තලාතුඔයෙන් කෑගල්ලට මාරු විය. කොඩිකාර දරුවාගේ වේලාපත්කඩය හැදූ ජ්‍යොතිෂවේදියා විසින් කියන ලද අනාවැකියක් හේතුවෙන් එතෙක් පාසල් අධ්‍යාපනයට වරම් අහිමිව සිටි ඔහු මුල් වරට පාසලකට ඇතුළුවන්නේ කෑගල්ලේදීය. ඒ කෑගල්ල පිටිහුම බෞද්ධ මිශ්‍ර පාඨශාලාවටය. එහි හතරවන ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිටියදී සිදුවන සිය මවගේ හදිසි අභාවය හේතුවෙන් ඔහුගේ පාසල් අධ්‍යාපනය බිඳවැටෙනවා පමණක් නොව පවුලේ සෙස්සන්ගේ ඇසුරෙන්ද වෙන්ව පියා සමග ගල්කිස්සේ පදිංචියට පැමිණීමට සිදුවූයේය.*

*ගල්කිස්සේ සිටියදී රත්මලාන පරමධම්ම චේතිය පිරිවෙනට ඇතුළත්ව අධ්‍යාපනය ලබන කොඩිකාර දරුවා ඒ අතර කොග්ගල සිරිරතන නමින් පැවිදි දිවියට ඇතුළත් විය. එහෙත් කෙටි කලකින් උපවැදිව නැවතත් සිය පියා ඇසුරට යන ඔහු දේශිය වෛද්‍ය විද්‍යාව හැදෑරීම සඳහා කොග්ගල පඤ්ඤාරංසි හාමුදුරුවන් වෙත බාර කරන්නේ පියා විසිනි. අනතුරුව ඔහුගේ නවාතැන වූයේ කොග්ගල දේවගිරි රජමහා විහාරයයි. එහි වෙදකම ඉගෙන ගනිමින් සිටින අතර හේ 1947 වසරේදී ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයන්ට පෙනී සිටියේය. විභාග ප්‍රතිපල එන තෙක් කෙටි කාලීන රැකියා-වක් සඳහා කොළඹ පොත් සාප්පුවකට පැමිණීම ඔහුගේ ජීවිතය වෙනස් මාවතකට යොමු කළේය.*

*මරදාන නොරිස් කැනල් පාරේ පිහිටි 'සිංහල ජාතිය' පත්තර කන්තෝරුවේ කතු මඩුල්ලේ සිරිලාල් කොඩිකාර වෙනුවෙන් අසුනක් වෙන්කෙරෙන්නේ 1948 අප්‍රේල් මාසයේදීය. ඒ ඔහුගේ මාධ්‍ය ජීවිතයේ ඇරඹුම විය. 'සිංහල ජාතිය' පුවත්පත ප්‍රකාශනය නැවැත්වීමෙන් පසු ඔහු 'දවස' පුවත්පතට වාර්තාකරුවකු ලෙස සම්බන්ධ වී කෙටි කලකින්ම එහි උප කර්තෘවරයකු බවට පත්විය. පසු අවස්ථාවක 'දවස' පුවත්පතේ දේශපාලන ගමන් මගට විරෝධය පළකරමින් තවත් මාධ්‍යවේදීන් පිරිසක් සමග ඉන් ඉල්ලා අස්වන සිරිලාල් අනතුරුව 'ඇත්ත' පුවත්පතට සම්බන්ධ විය.*

**එක්තරා කාලයක මාධ්‍යවේදියෙක් විදිහටත්, කවියෙක් විදිහටත් බොහොම කාර්ය බහුල ජීවිතයක් උරුම කරගෙන හිටිය ඔබ දැන් ජීවිතයේ සැන්දෑ සමය ගෙවමින් සිටින්නේ කොයි විදිහටද?**

මම දැන් ඉන්නේ පන්නිපිටියේ මගේ දුවගේ ගෙදර. දුව වෛද්‍යවරියක්. බෑණා ජාත්‍යන්තර පාසලක් කරනවා. මෙතන මට උවමනා කරන මූලික පහසුකම් හැම දෙයක්ම අඩුවක් නැතිව ලැබෙනවා. බුදු දහමට අනුව ආහාර, වස්ත්‍ර, බෙත්, නවාතැන් කියන මූලික අවශ්‍යතා හතර තමයි කෙනෙකුට ජීවත්වෙන්න අත්‍ය අවශ්‍ය වෙන්නේ. ඒවා පන්සලේ ඉන්නකොට වගේම මෙහෙදිත් ලැබෙනවා. උදේට ටිකක් ව්‍යායාමයට ඇවිදිනවා. ඉඳලා හිටලා මේ වගේ කෙනෙක් ආවම කතා බහ කර කර ඉන්නවා. මම අලුතින්ම මගේ ජීවිත කතාව පොතක් විදිහට ලියන්න පටන් අරගෙන දැන් ඒකත් කරගෙන යනවා. 'මහල්ලෙකුගේ හෑල්ලක්' කියලා. පළවෙනි පරිච්ඡේදය ලියලා ඉවරයි.

**'හෑල්ලක්' කියන වචනේ ඔබ වගේ කෙනෙකුගේ ජීවිත කතා පොතට නමක් විදිහට යොදන එක හරි මදි වගෙයි මට නම් හැගෙන්නේ.?**

දැනට ඒ නම තමයි හිතාගෙන ඉන්නේ. ස්ථිර-වම නෙවෙයි. සමහර වෙලාවට වෙනස් වෙන්නත් ඉඩ තියනවා. 'හෑල්ල' කියන වචනයේ තේරුම 'කතාවක්' කියන එකනේ. 'ගණදෙවි හෑල්ල', 'පත්තිනි හෑල්ල' ඔය වගේ. ඒ අදහසින් තමයි ඒක ගත්තේ.

**දැන් වයස අවුරුදු අසූඅටක්නේ. ගෙවුණු ජීවිතේ දිහා ආපහු හැරිලා බලනකොට මොකද හිතෙන්නේ? පැවිදි ජීවිතයේ හිටියා නම් මීට වඩා හොදයි කියලා වගේ හිතෙන්නේ නැත්ද?**

මට හිතෙන්නේ මහණ වුණාට වැඩිය මේ ගතකරන ජීවිතය හොදයි කියලා. මම මහණ වුණේ පන්සල ගැන වැරදි අවබෝධයකින්. මම හිතන් හිටියේ මහණ වුණාට පස්සේ තියෙන්නේ බණ භාවනා කරගෙන ආගමික වැඩ ටික කරගෙන බොහොම ශාන්ත ජීවිතයක් ගත කරන එක කියලා. ඒත් පන්සලේදි මම ලබපු අත්දැකීම්වලින් තේරුණා ඒක එහෙම නෙවෙයි කියලා. එතන තියෙන්නෙත් ගිහි ජීවිතයට සමානකමක් කියලා. එහෙම නම් ඉතිං ඊට වැඩිය ගිහි ජීවිතය හොදයි කියලා තමයි මම සිවුර ඇරලා ආවේ.එදා ගත්ත ඒ තීරණය ගැන මගේ කණගාටුවක් නෑ.

**බාල කාලයේදිම ඔබේ හිත පැවිද්දට යොමුවෙන්න බලපෑව පසුබිම මොකක්ද?**

මගේ හිත නෙවෙයි මුලින්ම ඒකට යොමුවෙලා තිබිලා තියෙන්නේ. තාත්තගෙයි අම්මගෙයි හිත්. මොකද මගේ වේලාපත්කඩය හදපු නක්ෂත්‍රකාරයා කියලා තියනවා මට පැවිදි යෝගයක් තියනවා ඒ නිසා මාව මහණ කරන්න හොදයි කියලා. ඒ නිසා තාත්තයි අම්මයි මුල ඉදළම මාව මහණ කරන බලාපොරොත්තුවෙන් තමයි වැඩ කරලා තිබුණේ. ඉස්කෝලෙකට දාන්නෙත් නැතුව ගෙදර තියාගෙන පන්සලට ගැලපෙන දේවල් තමයි ගෙදරදි උගන්නලා තිබුණෙත්. තාත්ත මාත් එක්ක ගල්කිස්සට ආවට පස්සේ  මම රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙනට ඇතුළු වුණා. එතන ඉගෙන ගනිමින් ඉන්න කොට සමූහයක් එක සැරේ මහණ කරන උත්සවයකදි කොග්ගල සිරිරතන නමින් පැවිදි වුණා.

**ඒ නක්ෂත්‍ර අනාවැකිය නොවෙන්න බාල කාලයේ ඔබේ ජීවිතය මීට වෙනස් එකක් වෙන්න තිබුණා නේද? කො-හොම වුණත් පස්සේ ඔබට කොග්ගල පඤ්ඤාරංසි හාමුදුරුවෝ ළග නක්ෂත්‍රය හදාරන්න අවස්ථාව ලැබෙනවානේ. එතකොට ඔබේ කේන්දරයේ තියන දේවල් ගැන මොකක්ද දැනගන්න ලැබුණේ?**

ගුරු හාමුදුරුවෝ ළගදි මට නක්ෂත්‍රය ඉගෙන ගන්න ලැබුණේ නෑ. මාව බාරගත්තට පස්සේ හාමුදුරුවෝ කිව්වා මුලින්ම වෙදකම ඉගෙන ගමු. ඊළගට නක්ෂත්‍රය, යන්ත්‍ර මන්ත්‍ර ඉගෙන ගනිමු කියලා. වෙදකම ඉගෙන ගන්න අතරේ තමයි මට කොළඹ රස්සාවකට එන්න වෙන්නේ. එතනින් මම පත්තරවලට සම්බන්ධ වුණාට පස්සේ වෙදකම ඉගෙන ගන්න එකත් එතනින්ම නතර වුණා. මුලදි නම් නක්ෂත්‍රය ගැන මගේ විශ්වාසයක් තිබුණේ නෑ. මම නක්ෂත්‍රය විවේචනය කළා. 1956 ජුනි 22 දා උදේ හතයි හතට සූර්ය ග්‍රහණයක් තිබුණා. මේක ගැන නමගිය නක්ෂත්‍රකාරයෝ ගණනාවක් අනා-වැකි කියලා තිබුණා. හැබැයි මේක සිද්ධවෙන වෙලාව හරියටම කියන්න ඒ කාටවත් පුළුවන්කමක් ලැබුණේ නෑ. හරියටම කිව්වේ තාරකා විද්‍යාඥයෝ විතරයි. නක්ෂත්‍රකාරයෝ කිව්වේ ආසන්න වෙලාවල්. ඉතිං මගේ තර්කය වුණේ නව ග්‍රහයින් අතරින් සූර්යාට සම්බන්ධ දෙයක්වත් ටක්කෙට කියන්න බැරි නක්ෂත්‍රකාරයෝ කොහොමද මේ කෝටි ගාණක් මිනිස්සු අතරින් එක් කෙනෙකුට වෙන දෙයක් හරියට කියන්නේ කියන එකයි. ඒත් දැන් මම නක්ෂත්‍රය විශ්වාස කරනවා. මොකද මගේ කේන්දරේ බලලා කියපු අනෙක් අනාවැකි මේ වෙනකොට හරිගිහින් තියන නිසා.

**ගෞරවනීය වෘත්තියක් වන වෛද්‍ය වෘත්තියට ඉගෙන ගත්ත එක පැත්තක දාලා පත්තර රස්සාවකට යන්න තීරණය කළේ ඇයි?**

මම ඉස්සෙල්ලා වෙදකම ඉගෙන ගත්තේ. සංස්කෘත භාෂාවෙන්. 'මාධව නිධානය' කියලා රෝග හඳුනාගැනීම ගැන පොතක් තිබුණා. 'සාර සංක්ෂේප' කියලා කසාය නියම කරන හැටි ගැන තව පොතක් තිබුණා. මේ පොත් මම කට පාඩම් කෙරුවා. ඊට පස්සේ මට තිබුණේ නාඩි සාස්තරේ ඉගෙන ගන්නයි. ඔය කාලේ මම කවි මඩුවලට එහෙමත් යනවා. ඒ යන ගමන්වලදී මම හදුනාගත්ත වැඩිහිටි වෛද්‍යවරු දෙන්නෙක් මගේ ඉගෙනීම ගැන හොයා බලලා මට කිව්වා ඔහොම ඉගෙන ගෙන නම් ලාල්ට වෙන්නේ

*හිරිකිත නැතුව මහ පන්දම් අල්ලන්ට*
*හරියට වරේ දුන් ධනපති පල්ලන්ට*
*දිරිගතහොතින් අදිරද වැට හොල්ලන්ට*
*බැරිවෙන එකක් නෑ අපි වැනි කොල්ලන්ට*

ගොඩ වෙදෙක් වෙන්න තමයි කියලා. හරියට වැඩේ කරගන්න නම් ආයුර්වේද විද්‍යාලයට බැදෙන්න ඕනේ කියලා. මම ඒක පිළිගත්තා. ඒත් මට ආයුර්වේදයට යන්න පොඩි ප්‍රශ්ණයක් තිබුණා. ඒ කාලේ ආයුර්වේදයට යන්න පාසලේ එස්එස්සී පාස්වෙලා තියෙන්න ඕනේ. මම පාසල් ගිහින් තිබුණේ නෑ. ඒ නිසා ප්‍රාචීන, ප්‍රාරම්භ විභාග පාස්වෙලා ඒ සුදුසුකමෙන් ආයුර්වේදයට යන්න මම තීරණය කළා.
ගුරු හාමුදුරුවෝ ඒකට අනුමැතිය දුන්නා. 1947 දී විභාගයට පෙනී හිටියා. එතකොට මම වැලිගම හිටියේ. ඉතිං විභාග ප්‍රතිපල එනකම් මම කොළඹ මාලිගාකන්ද පාරේ පොත් සාප්පුවක රස්සාවට ආවා. එතන වැඩ කරන ගමන් තමයි පත්තරවලට ලියන්න පටන් ගත්තේ. විභාගේ ප්‍රතිපල එනකොට මම පත්තර කලාවට සම්බන්ධවෙලා හිටියේ. ඒකෙන් මම ලොකු ආත්මතෘප්තියක් වින්දා. ඒ නිසා ආයුර්වේදයට යන